ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

# විගණන විමසුම - AUDIT QUERY - கணக்காய்வு விசாரணை

| | | | |
|---|---|---|---|
| විමසීම් අංකය / விசாரணை இலக்கம் / Query No. | SGLG/RT/B/PMPS/05/2025/AQ/07 | නිකුත් කරන දිනය / வழங்கிய திகதி / Date of Issue | 2025 ඔක්තොම්බර් 10 දින. |

Addressed to සභාපති, පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව. වෙතටයි அவர்களுக்கு

විෂයය / விடயம் / Subject } මූල්‍ය හා කාර්යසාධන විගණන - 2025

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව 13 OCT 2025 පැල්මඩුල්ල

**මෙය පැහැදිලි කර ගැනීම සඳහා තොරතුරු කැඳවීමක්/ විමසීමක් වන අතර විගණන වාර්තාවක් නොවේ.**
**இவ்விசாரணை தகவல்களைப் பெற்றுக் கொள்ளவும், பகுப்பாய்வதற்காகவுமே அன்றி இது ஒரு கணக்காய்வு அறிக்கை அல்ல.**
**This is only a query, calling information for clarification and not an audit report.**

උක්ත කරුණ සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේ දී පහත කරුණු නිරීක්ෂණය විය.

01. **සේවක ණය**

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 3.6 ඡේදය අනුව ආපදා ණය වලට අදාළ මාසික ණය වාරිකය මූලික වැටුපෙන් සියයට 10ක් විය යුතුය. එහෙත් සභාව විසින් නිලධාරීන්ගේ ආපදා ණය වාරිකය ගණනය කිරීමේ දී එපරිදි කටයුතු කර නොතිබුණි. ඒ අනුව නිලධාරීන් 58කට අදාළව රු.58,265ක් වැඩියෙන් (එක් වාරිකයක් සඳහා) හා නිලධාරීන් 13කට අදාළව රු.18,888ක් අඩුවෙන් (එක් වාරිකයක් සඳහා) අයකර තිබුණි. විස්තර ඇමුණුම I හි දැක්වේ.

(ආ) අපදා ණය ලිපිගොනු පරීක්ෂාවේ දී, සමාලෝචිත වර්ෂයේ සභාවේ නිලධාරීන් 04කු වෙත ලබා දී තිබූ එකතුව රු.750,000ක ණය මුදලට අදාළව ණයකරු විසින් ණය ගිවිසුමේ අත්සන් කර නොතිබීම, ඇපකරුගේ තොරතුරු සඳහන් කර නොතිබීම හා ණයකරුගේ වැටුප් විස්තර ඉදිරිපත් කර නොතිබීම යන අඩුපාඩු නිරීක්ෂණය විය. විස්තර ඇමුණුම II හි දැක්වේ.

(ඇ) වසර 10කට වඩා වැඩි කාලයක සිට හිඟහිට ඇති නිලධාරීන් 03 දෙනෙකුට අදාළ එකතුව රු.94,584ක් වූ හිඟ ණය ශේෂ අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. විස්තර පහත පරිදි වේ.

| අනු අංකය | නම | ණය වර්ගය | මුදල (රු:ශත) |
|---|---|---|---|
| 01 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බෝවත්තේ ඉන්ද්‍රරතන හිමි | උත්සව අත්තිකාරම් | 7,500 |
| 02 | එම්.ජී.චන්ද්‍රසේන මයා | උත්සව අත්තිකාරම් | 3,000 |
| | | වාහන | 1,640 |
| | | විශේෂ අත්තිකාරම් | 850 |
| | | ආපදා සේවක ණය | 37,240 |
| 03 | කේ.බී.වී.පද්මසිරි මයා | ආපදා සේවක ණය | 44,354 |
| | | එකතුව | 94,584 |

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

02. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2023 ජනවාරි 24 දිනැති ගැසට් පත්‍රයේ 3 (ආ) අනුව මාර්ග සිතියම්කරණ කටයුතු නිම කිරීමට වැඩිපුර කාලයක් සඳහා අවසර ඉල්ලා සිටීමට හැකි අතර, එකී කාලය 2023 ජනවාරි 24 දින සිට වසර 02ක කාලය හෝ ඉක්මන් කාලයක් විය යුතු බව සඳහන් කර තිබුණ ද, සභාව සතු මාර්ග 1109 න් විගණිත දින වන විට මාර්ග 418ක් පමණක් ගැසට් කර තිබූ බව නිරීක්ෂණය විය.

03. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371 (2) අනුව ලබා ගන්නා ලද අත්තිකාරම් අදාළ කාර්යය නිම වූ විගසම පියවිය යුතු වුවද, ප්‍රවර්ථන වර්ෂය තුළ දී අවස්ථා 09කදී ලබාගෙන තිබූ රු.71,660ක් වූ අත්තිකාරම් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය. විස්තර ඇමුණුම III හි දැක්වේ.

04. සභා බල ප්‍රදේශය තුළ ස්ථාපිත කර ඇති ස්ථිර දැන්වීම් පිළිබඳ 2025 වර්ෂයේ සමීක්ෂණයක් සිදු කර දැන්වීම් පුවරු 415ක් හඳුනාගෙන තිබුණි. ඉන් දැන්වීම් පුවරු 57කට අදාළව 2025 සැප්තැම්බර් 22 දිනට රු.342,571ක හිඟයක් පැවතුණි.

05. සභාව විසින් වරිපනම් කටයුතු සඳහා මෘදුකාංගයක් භාවිතා කරනු ලබයි. එම මෘදුකාංගයේ හා වරිපනම් ලේඛනයේ ඇතුළත් හිඟ ඒකක 10ක් පිළිබඳ සිදු කරන ලද නියැදි පරීක්ෂාවේදී මෘදුකාංගය හා ලේඛන අතර වෙනස්කම් පවතින බව නිරීක්ෂණය විය. විස්තර ඇමුණුම IV හි දැක්වේ.

06. අංක 2415 දරණ 2024 දෙසැම්බර් 13 දිනැති ගැසට් පත්‍රයේ කසළ ගාස්තු අයකිරීම් පිළිබඳ පළකර තිබූ අතර ඒ අනුව සභාව විසින් ආයතන 14කින් පමණක් කසළ ගාස්තු අය කරනු ලබයි. එම ආයතන 14න් විගණිත දින වන විට ආයතන 09කින් රු.144,000ක් අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. විස්තර පහත පරිදි වේ.

| ආයතනයේ නම | මාසික ගාස්තුව | හිඟ ගාස්තු |
|---|---|---|
| මැලිබන් පුද්ගලික සමාගම | 17,000 | 51,000 |
| සිල්වරේ හෝටලය | 20,000 | 40,000 |
| අචිනි හෝටලය | 1,500 | 3,000 |
| ගැමුණු හෝටලය | 3,500 | 3,500 |
| කුමාර හෝටලය | 3,500 | 3,500 |
| ඇඹුළු හෝටලය | 3,500 | 17,500 |
| වාඩිය හෝටලය | 3,500 | 14,000 |
| සුමිත් හෝටලය | 10,000 | 8,000 |
| Cargils food city | 3,500 | 3,500 |
| | 66,000 | 144,000 |

07. 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 93 වගන්තිය ප්‍රකාරව, සභා බල ප්‍රදේශය තුළ මලාපවහනය සහ කසළශෝධනය සම්බන්ධයෙන් ස්වකීය ප්‍රදේශය තුළ හැකිතාක් දුරට අවශ්‍ය සියලු පියවර ගැනීම ප්‍රාදේශීය සභා කාර්යය විය යුතු වුවත්, බල ප්‍රදේශය තුළ එක් රැස්වන කසළ විවෘත පරිසරයට බැහැර කිරීම සිදු කරන බව ස්ථානීය පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. තවද, ප්‍රාදේශීය සභා පනත 126 වගන්තිය ප්‍රකාරව, කසළ බැහැර කිරීම සම්බන්ධ අතුරු ව්‍යවස්ථා පනවා ගෙන නොමැති බව තවදුරටත් නිරීක්ෂණය කෙරේ.



08. පොදු තැන්පත් ලේඛන පරීක්ෂාව.

(අ) 2023,2024 හා 2025 වර්ෂ තුළ සභා බල ප්‍රදේශ තුළ පවත්වන ලද සංදර්ශනවලට අදාළව අයකරගෙන තිබූ 15% ක විනෝද බදු ආදායම වූ රු.129,000ක් සභා ආදායමට නොගෙන පොදු තැන්පත් ලෙස රඳවා ගෙන තිබුණි. විස්තර පහත දැක්වේ.

| | තැන්පත් කළ දිනය | ලදුපත් අංකය | විස්තරය | වටිනාකම |
|---|---|---|---|---|
| i. | 2023/11/30 | 012957 | මිණිකිරණ මෙලා | 15,000 |
| ii. | 2024/08/29 | 015914 | ග්‍රෑන්ඩ් සිල්වර් | 37,500 |
| iii. | 2024/10/03 | 016421 | මිණිකිරණ මෙලා | 4,500 |
| iv. | 2025/01/30 | 38635 | සර්කස් පැසිපියා | 27,000 |
| v. | 2025/02/17 | 38876 | සර්කස් පැසිපියා | 7,500 |
| vi. | 2025/03/14 | 39194 | සහරා රිසෝර්ට් | 22,500 |
| vii. | 2025/03/21 | 30270 | DUDDY LIVE IN RIDHAM | 15,000 |
| | | | | 129,000 |

(ආ) තැන්පත් ලේඛනයේ සඳහන් රු.11,281,855ක් වටිනා තැන්පත් ශේෂ 04ක් නිරවුල් කර තිබූ නමුත් විගණිත දින වූ 2025 සැප්තැම්බර් 22 දින වන විටත් තැන්පත් ලේඛනයේ නොගෙවූ තැන්පතු ශේෂ ලෙස රඳවා තිබුණි. විස්තර පහත දැක්වේ.

| අනු අංකය | තැන්පත් විස්තරය | තැන්පත් වටිනාකම | ගෙවන ලද දිනය | වවුචර් අංකය | ගෙවූ වටිනාකම |
|---|---|---|---|---|---|
| 01. | මහජන පරීක්ෂකවරුන්ගේ වැටලීම් සඳහා ඔවුන් වෙත ගෙවීම සඳහා ලද මුදල් | 30,125 | 2024/08/07 | 1383 | 30,125 |
| 02. | කහවත්ත කට්ටංගේ ශ්‍රී විමලදර්ශනාරාමයේ ප්‍රවේශ මාර්ගය අලුත්වැඩියා කිරීමේ කර්මාන්තය වෙනුවෙන් තැන්පත් කරන ලද කර්මාන්ත තැන්පත් | 31,221 | 2024/04/04 | 0635 | 31,221 |
| 03. | නාරංගොඩ 19 කොටස හරහා කොළණිය ජනපදය දක්වා මාර්ගය වැඩිදියුණු කිරීම සඳහා ලැබුණු මුදල් 1,220,509 | 1,220,509 | 2024/09/27 | 1645 | 1,220,509 |
| 04. | ස්ථාවර තැන්පත් ගිණුම පියවා මුදල් ලබාගැනීම | 10,000,000 | 2023/06/07 | 0955 | 10,000,000 |
| | | 11,281,855 | | | 11,281,855 |

09. ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ සැප්තැම්බර් 30 වන විට ඉටු කිරීමට අපේක්ෂා කරන ලද කාර්යයන් 27ක් අතුරින් කාර්යයන් 12ක් ඉටු කිරීමට විගණිත දින වන 2025 සැප්තැම්බර් 22 වන විටත් අපොහොසත්ව ඇත. විස්තර පහත පරිදි වේ.

| අංශය | 2025 සැප්තැම්බර් 30 දිනට ඉටු කිරීමට අපේක්ෂා කරන ලද කාර්යයන් ප්‍රමාණය | ඉටුකර නොමැති ප්‍රමාණය |
|---|---|---|
| ආයතන අංශය | 14 | 08 |
| පුස්තකාල සේවා | 13 | 04 |
| | 27 | 12 |

10. පරිසර බලපත්‍ර ලබාගත යුතු යැයි 2025 වර්ෂයේ හඳුනාගන්නා ලද කර්මාන්ත 03ක් සඳහා විගණිත දින වූ 2025 සැප්තැම්බර් 22 වන විටත් පරිසර බලපත්‍ර නිකුත් කර නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| | කර්මාන්ත විස්තරය | ප්‍රමාණය |
|---|---|---|
| i. | බලොග් ගල් ව්‍යාපාරය | 01 |
| ii. | පොල් තෙල් නිෂ්පාදන | 01 |
| iii. | සිමෙන්ති නිෂ්පාදන | 01 |

11. **කඩකාමර පරීක්ෂාව.**

(අ) සභාව සතු පොදු වෙළඳපොල සංකීර්ණයේ කඩකාමර 14ක් තක්සේරු දෙපාර්තමේන්තුවේ 2017 ඔක්තොම්බර් 13 දිනැති තක්සේරු වාර්තාව මගින් 2018 වර්ෂයේ සිට බදු දී තිබුණි. එක් කඩකාමරයක් සඳහා තක්සේරු කරන ලද කීමනි මුදල රු.720,000ක් විය. ඒ අනුව උක්ත කඩකාමර 14 සඳහා සභාවට අය විය යුතු කීමනි මුදල රු.10,080,000ක් වේ. එහෙත් මෙම කඩකාමර 14ට අදාළ කීමනි මුදල් අය කිරීම සිදු කළේ ද යන්න පිළිබඳව තොරතුරු විගණනය වෙත ඉදිරිපත් නොවුණි.

(ආ) උක්ත කඩකාමර 14, 2018 වර්ෂයේ සිට දීර්ඝකාලීන පදනම මත බදු දී තිබුණි. මෙම කඩකාමර 14 සඳහා බදුකරුවන් තෝරාගත් ආකාරය පිළිබඳ තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් නොවුණි.

12. **වාර්ෂික දේපළ බදු දීම් පරීක්ෂාව.**

(අ) සභාවට අයත් දේපළ 03ක් බිම් බදු අයකිරීමේ පදනම මත බදු දී තිබුණි. බදු ගැනුම්කරුවන් සමඟ ඇති කරගත් ගිවිසුමේ කොන්දේසි අංක 06 යටතේ එකී දේපළ ඉදිකිරීමක් නොවන වගා කටයුතු හෝ වෙනත් කාර්යයක් සඳහා මිස, බදු දීමනාකරු වෙත ඉල්ලීමක් කොට ඔහුගේ කැමැත්ත ලියවිල්ලකින් කල් ඇතිව ලබා නොගෙන වෙන මොනම කටයුත්තක් සඳහාවත් පාවිච්චි නොකළ යුතු බවට එකඟ වී තිබුණි. නමුත් උක්ත බිම් කොටස් 03හි ස්ථිර ඉදිකිරීම් සිදුකර වෙළඳ ව්‍යාපාර පවත්වාගෙන යන බව නිරීක්ෂණය විය. තවද මෙම ඉදිකිරීම් සභාවේ අනුමැතියකින් තොරව සිදුකර ඇති බවත් නිරීක්ෂණය විය. විස්තර පහත පරිදි වේ.

| අනු අංකය | බිම් බදු ලබා දුන් ස්ථානය පිළිබඳ විස්තර | පවත්වා ගෙන යනු ලබන ව්‍යාපාරය | ඉදිකිරීමේ ස්වභාවය |
| --- | --- | --- | --- |
| 01. | විද්‍යාල මාවත සතිපොල අසල බිම කොටස | වී මෝලක් | ස්ථිර |
| 02. | විද්‍යාල මාවත සතිපොල අසල බිම කොටස | පොල්තෙල් අලෙවි සැල | ස්ථිර |
| 03. | විද්‍යාල මාවත සතිපොල අසල බිම කොටස | යතුරු පැදි සේවා ස්ථානය | ස්ථිර |

(ආ) උක්ත දේපළ වගා කටයුතු සඳහා 2018 වර්ෂයේ සිට ගිවිසුම්ගතව බදු දී තිබුණි. වසර 03කට වරක් මෙම ගිවිසුම් අලුත්කිරීම් සිදුකර තිබුණි. 2023 වර්ෂයේ තක්සේරු කිරීම සිදු කරන අවස්ථාව වන විටත් මෙම බිම් කොටස්වල ස්ථිර ඉදිකිරීම් සිදුකර තිබුණි. එහෙත් ගිවිසුම් ගත වීමේ දී තවදුරටත් වගා කටයුතු සඳහා බදු දීමක් සිදුවන බවත් නිරීක්ෂණය විය. ඒ අනුව සභාව විසින් මෙම ස්ථිර ඉදිකිරීම් සම්බන්ධයෙන් හා ගිවිසුම් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. ඒ හේතුවෙන් දේපළවල ආරක්ෂාව සම්බන්ධයෙන් ඉදිරියේ දී ගැටලුකාරී තත්ත්වයන්ට මුහුණපෑමට සිදුවීමේ හැකියාවක් පවතින බවත් නිරීක්ෂණය කෙරේ.

(ඇ) රජයේ තක්සේරු දෙපාර්තමේන්තු අංක RT/LM/10362 හා 2023 ජනවාරි 18 දිනැති තක්සේරු වාර්තාව 2023 වසර සඳහා පමණක් ලබා දී තිබුණි. සභාව විසින් මෙම තක්සේරු මත පදනම්ව 2024,2025 වර්ෂය සඳහාද බදු දී තිබුණි. කාලීනව බදු කුලී තක්සේරු නොකිරීම හේතුවෙන් සභාවට මූල්‍යමය අලාභයක් සිදු වී ඇති බව නිරීක්ෂණය විය.

(ඈ) මෙම ස්ථාන වාර්ෂික පදනමින් බදු දෙන නමුත් වාර්ෂිකව ටෙන්ඩර් කිරීමක් සිදු නොකර එකම බදුකරු වෙත ගිවිසුම් අලුත් කිරීමක් මගින් බදු දී තිබුණි.

(ඉ) වර්ෂික පදනම මත බදු දෙන පැල්මඩුල්ල පොදු වෙළඳපොල කඩකාමර අංක 14 මාළු කඩය 2021 රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් තක්සේරු කර නොතිබුණි. මෙම තක්සේරුව 2022 වර්ෂය සඳහා පමණක් ලබා දී තිබුණි. නමුත් එම තක්සේරුව මත පදනම්ව උක්ත දේපළ 2023,2024,2025 වර්ෂවලදී ද බදු දී තිබුණි. ඒ අනුව වාර්ෂිකව තක්සේරුකිරීමකින් තොරව එකම බදු කුලියක් යටතේ බදු දී තිබුණි. මේ හේතුවෙන් සභාවට මූල්‍ය පාඩුවක් ද සිදු ව තිබුණි.

## 13. නොවිසඳුණු විගණන ඡේද

(අ) නිවාස යෝජනා ක්‍රමයක් ඇති කිරීම සඳහා එවකට පැවති ගම් සභාව වෙත 1962 ජුනි 18 දින ලබා දී තිබුණ අක්කර 03 පර්චස් 39.3ක ඉඩම තුළ පුද්ගලයන් 43 දෙනෙකු ස්ථිර නිවාස ඉදිකර පදිංචිව තිබුණි. ඉඩම් කොටස් පවරාදීමේ කාර්යය සඳහා පිඹුරුපත් සකසා මායිම් ගල් දැමීමට හා ඉඩම් කොටස් තක්සේරු කිරීමට 2005 හා 2007 වර්ෂවලදී රු.204,229ක් වැය කර තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අදාළ පුද්ගලයින් වෙත ඉඩම් කොටස් විධිමත්ව පවරාදීමට කටයුතු කර නොතිබුණි.

CamScanner

373

(ආ) දීර්ඝ කාලීනව බැංකු සැසඳුමේ පවතින ගැටලු නිරාකරණය කිරීමට අදාළ පරීක්ෂණ වාර්තාව පදනම් කර ගනිමින් ඒ ඒ කාලයේ ධූරය හෙබවූ සභාපතිවරුන්ගෙන් රු.625,917 ක් අය කිරීමට 2024 අගෝස්තු 26 දින සහකාර පළාත් පාලන කොමසාරිස් නිර්දේශ කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

එච්.එම්.කේ.කේ.හේරත්,

විගණන අධිකාරි,

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති වෙනුවට.

එච්.එම්.කේ.කේ. හේරත්
විගණන අධිකාරි
ජාතික විගණන කාර්යාලය
බත්තරමුල්ල

පිටපත :- පළාත් පාලන කොමසාරිස්, සබරගමුව පළාත් සභාව - කා.දැ.පි./ අ.ක.ස.

CamScanner

ඇමුණුම I

යොමුව :- 01. (අ) ඡේදය

ආපදා ණය

| අනු අංකය | නම | තනතුර | ණය ලබාගත් දිනය | ණය ලබාගත් දිනට මූලික වැටුප | ආපදා ණය මුදල් ශේෂය | ලබාගත් ණය මුදල | මුළු ණය මුදල | දැනට අයකරන වාරිකය | අය කළ යුතු වාරිකය | වෙනස |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | ආර්.ඒ.කේ.කේ.ජේ.ගුණතිලක මයා | ලේකම් | 2022.07.15 | 40,830 | 145,000 | 105,000 | 250,000 | 4,200 | 4,083 | 117 |
| 2 | වී.ආර්.දන්ගල්ල මිය | කළ.සේ.නි. | 2024.07.01 | 32,990 | 153,400 | 96,600 | 250,000 | 4,200 | 3,299 | 901 |
| 3 | එච්.එච්.ඩී.එම්.ගුණසේකර මිය | කළ.සේ.නි. | 2024.04.26 | 31,640 | - | 200,000 | 200,000 | 3,400 | 3,164 | 236 |
| 4 | ඒ.ඩබ.එම්.එම්.ගලගම මිය | කළ.සේ.නි. | 2024.04.26 | 30,440 | - | 200,000 | 200,000 | 3,400 | 3,044 | 356 |
| 5 | ඩී.ජේ.අයි.කේ.ජයතුංග මිය. | කළ.සේ.නි. | 2024.06.03 | 30,440 | 151,000 | 99,000 | 250,000 | 4,500 | 3,044 | 1,456 |
| 6 | ටී.එම්.වී.එස්.තෙන්නකෝන් මිය | කළ.සේ.නි. | 2023.09.26 | 31,340 | - | 233,067 | 233,067 | 3,400 | 3,134 | 266 |
| 7 | ආර්.එස්.වී.එච්.එන්.එස්.වීරරත්න මයා | කළ.සේ.නි. | 2024.02.01 | 30,140 | 122,500 | 100,000 | 222,500 | 3,800 | 3,014 | 786 |
| 8 | ජේ.ඩී.එන්.චන්දිමා මිය | කළ.සේ.නි. | 2025.01.20 | 29,840 | - | 220,676 | 220,676 | 3,000 | 2,984 | 16 |
| 9 | එස් රත්නාවතී මැණිකේ මිය | සං.නිල. | 2024.05.28 | 46,850 | - | 200,000 | 200,000 | 5,300 | 4,685 | 615 |
| 10 | ඩී.එල්.නදීෂා දීපානි මිය | සං.නිල. | 2024.03.03 | 33,715 | 127,400 | 100,000 | 227,400 | 4,200 | 3,372 | 829 |
| 11 | එන්.පී.එම්.විජේදෝරු මිය | සං.නිල. | 2025.02.05 | 41,880 | 115,000 | 100,000 | 215,000 | 5,700 | 4,188 | 1,512 |
| 12 | ඒ.බී.එස්.සේනාරත්න මිය | සං.නිල. | 2025.09.29 | 53,864 | 36,940 | 363,060 | 400,000 | 6,700 | 5,386 | 1,314 |



CamScanner

371

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 13 | බී.කේ.ඩබ්.එස්.විජේලතා මිය | සං.නිල. | 2025.04.01 | 33,270 | 132,000 | 100,000 | 232,000 | 3,900 | 3,327 | 573 |
| 14 | ආර්.ඒ.ඩී.බී.රණසිංහ මිය | සං.නිල. | 2025.01.08 | 32,380 | 116,800 | 100,000 | 216,800 | 3,600 | 3,238 | 362 |
| 15 | ආර්.ඒ.ඩී.රණසිංහ මිය | සං.නිල. | 2023.07.27 | 31,935 | - | 200,000 | 200,000 | 6,000 | 3,194 | 2,807 |
| 16 | එච්.පී.එච්.එම්.විජේසිරි මිය | සං.නිල. | 2024.04.02 | 32,380 | - | 200,000 | 200,000 | 3,400 | 3,238 | 162 |
| 17 | ඊ.බී.එම්.ඩී.පුෂ්පකුමාරි මිය | සං.නිල. | 2023.08.28 | 31,935 | - | 200,000 | 200,000 | 3,400 | 3,194 | 207 |
| 18 | බී.එම්.එන්.පී.ගුණතිලක මිය | සං.නිල. | 2024.08.01 | 32,380 | - | 200,000 | 200,000 | 3,400 | 3,238 | 162 |
| 19 | කේ.එච්.ජේ. ජයසිංහ මිය | සං.නිල. | 2024.09.04 | 32,380 | 141,500 | 100,000 | 241,500 | 6,000 | 3,238 | 2,762 |
| 20 | එච්.කේ.ආර්.ද සොයිසා මිය | සං.නිල. | 2024.06.14 | 32,380 | - | 200,000 | 200,000 | 3,400 | 3,238 | 162 |
| 21 | එම්.බී.වයි.නිමේෂිකා මිය | සං.නිල. | 2024.07.22 | 32,380 | - | 200,000 | 200,000 | 5,000 | 3,238 | 1,762 |
| 22 | ඩබ්.ආර්.මල්කාන්ති මිය | සං.නිල. | 2023.12.04 | 31,935 | - | 200,000 | 200,000 | 3,400 | 3,194 | 207 |
| 23 | එස්.එන්.ප්‍රියදර්ශනී මිය | සං.නිල. | 2024.04.26 | 40,560 | 115,080 | 100,000 | 215,080 | 4,200 | 4,056 | 144 |
| 24 | කේ.එම්.ඩී.එස්.සෙනෙවිරත්න මිය | සං.නිල. | 2024.06.18 | 36,600 | - | 224,950 | 224,950 | 4,000 | 3,660 | 340 |
| 25 | එම්.වී.ඒ.පුෂ්පසූරිය මිය | සං.නිල. | 2024.12.19 | 36,600 | - | 241,355 | 241,355 | 3,700 | 3,660 | 40 |
| 26 | ටී.ඩී.කේ.පෙරේරා මයා | කා.කා.ස. | 2024.08.01 | 26,750 | 67,400 | 100,000 | 167,400 | 3,400 | 2,675 | 725 |
| 27 | එල්.පී.හෙට්ටියාවත්ත මයා | වැ.ක්.කම්. | 2025.02.28 | 28,370 | 111,400 | 100,000 | 211,400 | 4,200 | 2,837 | 1,363 |
| 28 | එච්.ඩී.රංජිත් පෙරේරා මයා | රියදුරු | 2024.10.01 | 28,760 | - | 200,000 | 200,000 | 15,100 | 2,876 | 12,224 |
| 29 | අයි.ඒ.සී.සිරිවර්ධන මයා | රියදුරු | 2025.05.02 | 28,220 | 90,600 | 100,000 | 190,600 | 3,200 | 2,822 | 378 |
| 30 | ආර්.රසිකා ප්‍රියංගනී මිය | කා.කා.ස. | 2024.02.01 | 24,250 | 120,000 | 100,000 | 220,000 | 3,700 | 2,425 | 1,275 |
| 31 | ජී.ජී.ඉරේෂා ලක්මාලි මිය | කා.කා.ස. | 2024.02.01 | 24,750 | - | 200,000 | 200,000 | 4,500 | 2,475 | 2,025 |
| 32 | කේ.ආර්.ටී.කොස්වින්න මයා | මුරකරු | 2024.01.02 | 27,830 | 35,000 | 100,000 | 135,000 | 2,900 | 2,783 | 117 |
| 33 | කේ.ඩී.ඩී.එන්.නන්දසේන මයා | මුරකරු | 2021.03.15 | 27,560 | - | 250,000 | 250,000 | 4,200 | 2,756 | 1,444 |
| 34 | එම්.ඩබ්.ජේ.පී.කුමාර මයා | කා.කා.ස. | 2024.08.01 | 24,250 | - | 200,000 | 200,000 | 3,400 | 2,425 | 975 |
| 35 | ජී.කේ.එල්.ඩී.ජයතිලක මයා | මුරකරු | 2025.01.08 | 24,500 | - | 100,000 | 100,000 | 2,500 | 2,450 | 50 |



CS CamScanner

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 36 | එච්..ඒ.ඩී.ඩබ්.කුමාර මයා | ආ.ක්‍රියාකරු | 2025.01.29 | 29,030 | 67,400 | 100,000 | 167,400 | 3,400 | 2,903 | 497 |
| 37 | ඩබ්.ඒ.පී.ජේ.වීරසිංහ මයා | ආ.සහයක | 2022.05.25 | 25,750 | - | 250,000 | 250,000 | 4,200 | 2,575 | 1,625 |
| 38 | ඩබ්.එච්. සරත් මයා | සෞ.කම්. | 2023.01.09 | 27,000 | - | 150,000 | 150,000 | 3,300 | 2,700 | 600 |
| 39 | පී.ප්‍රියන්ත මයා | සෞ.කම්. | 2024.02.29 | 26,500 | - | 200,000 | 200,000 | 3,400 | 2,650 | 750 |
| 40 | වී.පී.මංගල මයා | සෞ.කම්. | 2022.04.29 | 26,000 | - | 250,000 | 250,000 | 4,200 | 2,600 | 1,600 |
| 41 | S.සෙල්වරාජා මයා | සෞ.කම්. | 2024.02.29 | 26,500 | - | 200,000 | 200,000 | 3,400 | 2,650 | 750 |
| 42 | ආර්.එච්.ඩී.ඩී කුමාර මයා | ආදා. සහ. | 2024.04.03 | 26,500 | - | 200,000 | 200,000 | 3,400 | 2,650 | 750 |
| 43 | වයි.එස්.කේ සිල්වා මයා | සෞ.කම්. | 2025.04.01 | 26,500 | - | 200,000 | 200,000 | 3,400 | 2,650 | 750 |
| 44 | එස්.සමින්ද මයා | සෞ.කම්. | 2024.02.29 | 25,750 | 121,400 | 100,000 | 221,400 | 3,700 | 2,575 | 1,125 |
| 45 | මලයාගු රාජු මයා | සෞ.කම්. | 2023.06.05 | 25,500 | - | 200,000 | 200,000 | 3,400 | 2,550 | 850 |
| 46 | වීරන් සුබ්‍රමනියම් මයා | සෞ.කම්. | 2024.09.02 | 26,000 | - | 200,000 | 200,000 | 3,400 | 2,600 | 800 |
| 47 | ආර්.විජේවීර මයා | සෞ.කම්. | 2025.02.03 | 24,250 | - | 200,000 | 200,000 | 3,400 | 2,425 | 975 |
| 48 | බී.එන්.එස්.අයි. යෝගරත්න මයා | කාර්මික නිලධාරි | 2023.03.09 | 37,470 | - | 150,000 | 150,000 | 3,800 | 3,747 | 53 |
| 49 | ඩී.ඩබ්.ඩී.වෙදගේ මිය | වැ.ක්.කම්. | 2024.07.12 | 28,100 | 153,400 | 96,600 | 250,000 | 4,200 | 2,810 | 1,390 |
| 50 | ඩී.වී.එච්.උපසේන මයා | වැ.ක්.කම්. | 2025.01.07 | 26,750 | 92,500 | 100,000 | 192,500 | 3,400 | 2,675 | 725 |
| 51 | එම්.ආර්.එස්.විජේසිංහ මයා | බර.වාහ.ක්‍රියා. | 2025.01.07 | 28,490 | - | 200,000 | 200,000 | 3,400 | 2,849 | 551 |
| 52 | ඩබ්.ජේ.බී.සේනාධීර මයා | වැ.ක්.කම්. | 2023.12.24 | 25,750 | - | 200,000 | 200,000 | 3,400 | 2,575 | 825 |
| 53 | එච්.පී.ටී.විජේසිංහ මයා | වැ.ක්.කම්. | 2023.03.03 | 24,500 | - | 150,000 | 150,000 | 3,000 | 2,450 | 550 |
| 54 | පී.ඒ.ඩී.ගුණවංශ මිය | වැ.ක්.කම්. | 2025.03.28 | 25,000 | 92,500 | 150,000 | 242,500 | 4,100 | 2,500 | 1,600 |
| 55 | එච්.වී.ආර්.පී.විතානගේ මිය | පුස්තකාල සහයක | 2024.06.03 | 26,750 | - | 200,000 | 200,000 | 3,400 | 2,675 | 725 |
| 56 | බී.එල්.ඒ.එස්.සඳමාලි ගුණසේකර මිය | පුස්තකාලාධිපති | 2023.05.17 | 35,490 | - | 200,000 | 200,000 | 3,600 | 3,549 | 51 |

369

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 57 | ඩී.වී.ටී.එස්.කේ.දැල මිය | පුස්තකාල සහයක | 2019.09.12 | 22,194 | - | 250,000 | 250,000 | 4,200 | 2,219 | 1,981 |
| 58 | කේ.එච්.එල්.එස්.විමලරත්න මයා | සෞ.කම්. | 2025.04.03 | 24,250 | - | 25,000 | 25,000 | 2,500 | 2,425 | 75 |
| | | | | 1,756,348 | 2,308,220 | 9,705,308 | 12,013,528 | 233,900 | 175,63 | 58,265 |

| අනු අංකය | නම | තනතුර | ණය ලබාගත් දිනය | ණය ලබාගත් දිනට මූලික වැටුප | ආපදා ණය මුදල් ශේෂය | ලබාගත් ණය මුදල | මුළු ණය මුදල | දැනට අයකරන වාරිකය | අය කළ යුතු වාරිකය | වෙනස |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | කේ.එම්.එන්.ගුණරත්න මිය | ආදායම් පරී. | 2025.10.07 | 41,317 | - | 100,015 | 100,015 | 3,400 | 4,132 | (732) |
| 2 | ජේ.පී.රුක්ෂලා මිය | සං.නිල. | 2025.05.01 | 51,123 | 85,060 | 100,000 | 185,060 | 3,400 | 5,112 | (1,712) |
| 3 | කේ.ජේ.උපනන්ද මයා | සං.නිල. | 2025.05.02 | 60,416 | 178,600 | 71,400 | 250,000 | 4,200 | 6,042 | (1,842) |
| 4 | ඩබ්.එම්.ටී.හර්ෂනී මිය | සං.නිල. | 2025.07.04 | 48,366 | 176,200 | 73,800 | 250,000 | 4,200 | 4,837 | (637) |
| 5 | ඩී.පීඑස්.සංජීව මයා | සං.නිල. | 2024.10.28 | 36,385 | 97,500 | 100,000 | 197,500 | 3,400 | 3,639 | (239) |
| 6 | පී.එච්.සුධම්මිකා මිය | සං.නිල. | 2025.05.26 | 53,864 | - | 200,000 | 200,000 | 3,400 | 5,386 | (1,986) |
| 7 | එම්.ඒ.එස්.කුමාරි මිය | සං.නිල. | 2025.05.02 | 54,683 | 48,940 | 100,000 | 148,940 | 3,000 | 5,468 | (2,468) |
| 8 | ඩී.එම්.නන්දසේන මයා | රියදුරු | 2023.02.09 | 32,090 | - | 150,000 | 150,000 | 2,500 | 3,209 | (709) |
| 9 | පී.පී.ජයලත් මයා | සෞ.කම්. | 2025.08.29 | 41,135 | 85,000 | 315,000 | 400,000 | 2,500 | 4,114 | (1,614) |
| 10 | එස්.දයානන්ද මයා | සෞ.කම්. | 2024.02.01 | 91,500 | 26,500 | 100,000 | 126,500 | 3,200 | 9,150 | (5,950) |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 11 | [illegible] | [illegible] | 2024.09.12 | 26,000 | 97,500 | 50,000 | 147,500 | 2,500 | 2,600 | (100) |
| 12 | [illegible] | [illegible] | 2023.07.24 | 38,033 | - | 200,000 | 200,000 | 3,400 | 3,804 | (404) |
| 13 | [illegible] | [illegible] | 2023.05.26 | 38,965 | - | 200,000 | 200,000 | 3,400 | 3,897 | (497) |
| | | | | | 795,300 | 1,760,215 | 2,555,515 | 42,500 | 61,388 | (18,888) |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 11 | ජී චන්ද්‍රකාන්ති මිය | සෞ.කම්. | 2024.09.12 | 26,000 | 97,500 | 50,000 | 147,500 | 2,500 | 2,600 | (100) |
| 12 | එච්.වී.එස්. විතානගේ මිය | වැ.ක්.කම්. | 2025.07.24 | 38,035 | - | 200,000 | 200,000 | 3,400 | 3,804 | (404) |
| 13 | ඒ.එස්.ඉන්දික මයා | විදුලි කාර්මික | 2025.05.26 | 38,965 | - | 200,000 | 200,000 | 3,400 | 3,897 | (497) |
| | | | | | 795,300 | 1,760,215 | 2,555,515 | 42,500 | 61,388 | (18,888) |

ැමුණුම II

යොමුව :- 01. (ආ) ඡේදය

| අයදුම්කරුගේ නම | අයදුම්පත්හි අඩුපාඩුව | ලබාගත් ණය මුදල (රු.) |
| --- | --- | --- |
| සුමිත් ඉන්දික | යෝජිත ඇපකරු ප්‍රකාශයේ ඇපකරුගේ නම පමණක් සඳහන් කර තිබීම. | 200,000 |
| දිල්රුක්ෂි ගුණවංශ | ණය ගිවිසුමේ අත්සන් කර නැත. | 150,000 |
| එච්.වී.එස්.විතාණගේ | ණය ගිවිසුමේ අත්සන් කර නැත. | 200,000 |
| පී.ෂුෂාණි සුධම්මිකා | වැටුප් විස්තරය නැත. | 200,000 |
| | | 750,000 |

CS CamScanner

366

ඇමුණුම III

යොමුව :- 03. ඡේදය

අත්තිකාරම්

| අත්තිකාරම් ලබාගත් දිනය | ලබාගත් ආකාරය | ලබාගත් මුදල (රු.) | පියවීමට මුදල (රු.) | අදාළ විස්තර පියවූ දිනය |
|---|---|---|---|---|
| 2025.01.23 | පැලමඩුල්ල මාර්ගපත උපකාර්යාලයේ විදුලි අලංකරණ කටයුතු සඳහා | 3000 | 3000 | 2025.05.26 |
| 2025.02.11 | ජංගම වැඩ සටහන් පැවැත්වීම (ආදායම් එකතු කිරීමට | 9,600 | 9,600 | 2025.04.04 |
| 2025.03.24 | PD 7614 කැබ් රථයෙහි ආදායම් බලපත්‍රය හා දුම් වාර්තාව ලබා ගැනීම. | 13,180 | 13,180 | 2025.04.24 |
| 2025.04.22 | ළමා හා මාතෘ සායන වැඩසටහන් ටටට පවුල් සෞඛ්‍ය නිලධාරි කාර්යාලයේ පැවැත්වීමට | 7,000 | 7,000 | 2025.05.26 |
| 2025.08.13 | 2025 අගෝස්තු මාසය සඳහා පැවැත්වීමට නියමිත තාක්ෂණික ප්‍රගති සමාලෝචන කමිටුව පැමිණි නිලධාරීන් සඳහා | 6,000 | 6,000 | 2025.08.29 |
| 2025.04.28 | වාර්ෂික සැලැස්මට අනුව අලුත් අවුරුදු උත්සවය සඳහා වැඩිහිටි නිවාසයේ සිටින වැඩිහිටියන් සඳහා අවුරුදු උත්සවයේ සංග්‍රහ කටයුතු කිරීම | 10,000 | 10,000 | 2025.05.26 |
| 2025.07.04 | Payroll වැඩසටහන සඳහා 2025.07.04 දින සංග්‍රහ කටයුතු වෙනුවෙන් අත්තිකාරම් ලබා ගැනීම | 4,000 | 4,000 | 2025.07.24 |
| 2025.06.04 | ZA 5173 මැකෝ යන්ත්‍රයේ ආදායම් බලපත්‍රය, දුම් වාර්තාව හා යෝග්‍යතා සහතිකය ලබා ගැනීම සඳහා | 10,690 | 10,690 | 2025.07.21 |
| 2025.06.04 | LF- 4824 කැබ් රථයේ ආදායම් බලපත්‍රය, දුම් වාර්තාව හා යෝග්‍යතා සහතිකය ලබා ගැනීම සඳහා | 8,190 | 8,190 | 2025.07.21 |
| | | 71,660 | 71,660 | |

ඇමුණුම IV

යොමුව :- 05. ඡේදය

| පාර | අනු අංකය | වරිපනම් අංකය | ලේඛන අනුව ගෙවිය යුතු අගය (රු.) | පද්ධතිය අනුව ගෙවිය යුතු අගය (රු.) | වෙනස (රු.) |
|---|---|---|---|---|---|
| ----- | -------- | --------------- | ------------------ | -------------------- | --------- |
| බලංගොඩ පාර වම | | | | | |
| | 01 | 219/D | 1,155 | 1,552 | (397) |
| | 02 | 229 | 2,403 | 3,204 | (801) |
| | 03 | 265 | 2,137 | 710 | 1427 |
| | 04 | 281 | 1,694 | 3,209 | (1516) |
| | 05 | 307 | 1,009 | 2,654 | (1645) |
| | 06 | 309/3 | 1,264 | 2,217 | (953) |
| | 07 | 499 | 2,225 | 3,351 | (1126) |
| රක්වාන පාර දකුණ | | | | | |
| | 08 | 686/B | 1,532 | 1,803 | (271) |
| | 09 | 716 | 2,582 | 5,184 | (2602) |
| | 10 | 728/4 | 2,372 | 4,321 | (1949) |
| | 11 | 718 | 1,150 | 4,658 | (3508) |
| | 12 | 732/6 | 6,459 | | 6459 |
| | 13 | 732/4 | 1,468 | (22) | 1490 |
| | | | ----------- | ---------- | |
| | | | 27,450 | 32,841 | |
| | | | ======= | ====== | |

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

## විගණන විමසුම - AUDIT QUERY - கணக்காய்வு விசாரணை

| | | | |
|---|---|---|---|
| විමසීම් අංකය<br>விசாரணை இலக்கம்<br>Query No. | SGLG/RT/B/PMPS/05/2025/AQ/07 | නිකුත් කරන දිනය<br>வழங்கிய திகதி<br>Date of issue | 2025 ඔක්තොම්බර් 10 දින. |

Addressed to සභාපති, පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව. වෙතටයි அவர்களுக்கு

විෂයය<br>விடயம்<br>Subject } මූල්‍ය හා කාර්යසාධන විගණන - 2025

**මෙය පැහැදිලි කර ගැනීම සඳහා තොරතුරු කැඳවීමක්/ විමසීමක් වන අතර විගණන වාර්තාවක් නොවේ.**
**இவ்விசாரணை தகவல்களைப் பெற்றுக் கொள்ளவும், தெளிவுபடுத்துவதற்காகவுமே அன்றி இது ஒரு கணக்காய்வு அறிக்கை அல்ல.**
**This is only a query, calling information for clarification and not an audit report.**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව
13 OCT 2025
පැල්මඩුල්ල

උක්ත කරුණ සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේ දී පහත කරුණු නිරීක්ෂණය විය.

01. ප්‍රසම්පාදන පරීක්ෂාව

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2412/01 දරණ 2024 නොවැම්බර් 25 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් 2025 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය හඳුන්වා දී තිබුණි. 2025 ජනවාරි 01 දින සිට පළාත් පාලන ආයතන භාණ්ඩ, වැඩ හා උපදේශන නොවන සේවා ප්‍රසම්පාදනයේ දී මෙම මාර්ගෝපදේශය පරිදි කටයුතු කළ යුතු ය.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2024 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.7.4 ප්‍රකාරව, ප්‍රසම්පාදන කමිටුවක සංයුතිය සඳහා ආයතනයේ මාණ්ඩලික නිලධාරි 02කු සමාජිකයෙකු විය යුතු අතර, ලංසු ඇගයීම් කමිටුවක් නොමැති විට විෂය පිළිබඳ විශේෂඥයෙකු සමාජිකයෙකු විය යුතු ය. 1988 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති අංක 178 ප්‍රකාරව, ප්‍රාදේශීය සභාව විසින් ටෙන්ඩර් මණ්ඩලය ලෙස මුදල් කමිටුව පත්කර තිබුණි. එසේ වුවද, මෙම මුදල් කමිටුවේ මාණ්ඩලික නිලධාරීන් හෝ විශේෂඥ දැනුමැති පුද්ගලයින් නොමැති බව නිරීක්ෂණය විය.

(ඇ) 2024 ප්‍රසම්පාදන අත් පොතෙහි 2.2, 2 (ඇ) (VI) ප්‍රකාරව, ගණන්දීමේ නිලධාරි විසින් ලංසු විවෘත කිරීමේ කමිටුවක් පත්කිරීම සිදු කළ යුතු වුවද, ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂයේ ප්‍රසම්පාදන කටයුතු වෙනුවෙන් ලංසු විවෘත කිරීමේ කමිටුවක් පත්කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.6 (අ) වගන්තිය ප්‍රකාරව, ලංසු විවෘත කිරීමේ කමිටුව විසින්, ලංසුකරුවන්ගේ, ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කළ යුතු බව සඳහන් වේ. එහෙත් ප්‍රාදේශීය සභාව වෙත ලැබෙන ලංසු,මිල කමිටුව විසින් විවෘත කිරීම සිදු කරන බව නිරීක්ෂණය විය. තවද මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.6 (ඇ) වගන්තිය ප්‍රකාරව, ලංසු විවෘත කිරීමේ රැස්වීම් වාර්තා නියමිත ආකෘතීන් අනුව පවත්වා යා යුතු වුවත්, සභාව විසින් එපරිදි කටයුතු කර නොතිබුණි.

(ඉ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.4 (ඇ) වගන්තිය ප්‍රකාරව, ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් ලංසු භාර ගැනීම සඳහා ලේඛනයක් පවත්වා ගත යුතු වුවද, එපරිදි කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඊ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.5 වගන්තිය ප්‍රකාරව, ප්‍රසම්පාදන කමිටුව විසින් ලබා දිය යුතු දිවුරුම ලබා දීම සිදුකර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(උ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.1 වගන්තිය ප්‍රකාරව, ප්‍රසම්පාදන තීරණ සම්බන්ධයෙන් ප්‍රසම්පාදන තීරණ පොත පවත්වා ගෙන ගොස් නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඌ) ප්‍රාදේශීය සභාවේ අංක RW-9848 ටෙලරය අලුත්වැඩියාව සඳහා ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ පරීක්ෂාව.

(i) උක්ත කාරණය සම්බන්ධයෙන් සිදුකළ මිල කැඳවුම් ලිපියේ පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

01. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3 ප්‍රකාරව, ලංසු යෝජනා ඉදිරිපත් කිරීමේ කාලය දක්වා නොතිබීම.

02. ප්‍රසම්පාදන අත්පොතෙහි 6.4 (ආ) ප්‍රකාරව, ලංසු යෝජනා භාරගැනීමේ ස්ථානය හා භාරදිය හැකි ආකාරය දක්වා නොතිබීම.

03. ප්‍රසම්පාදන අත්පොතෙහි 6.4 (අ) ප්‍රකාරව, ලංසු යෝජනා මුද්‍රා තැබූ කවර තුළ ඉදිරිපත් කළ යුතු ලෙසට දක්වා නොතිබීම.

04. වගකීම් කාලය සහ වෙනත් කොන්දේසි ඇතුළත් කර නොතිබීම.

(ii) කාර්යාලයට ලැබුණු ලංසු ලැබීම් ලේඛනයක ඇතුළත් කර නොතිබුණු අතර, විෂයය නිලධාරි ළඟ රඳවා තබා ගෙන තිබුණු බව නිරීක්ෂණය විය.

(iii) උක්ත කාරණයට අදාළව ලංසු යෝජනා 03ක් ප්‍රාදේශීය සභාව වෙත ලැබී තිබුණි.

01. මුදල් කමිටුව විසින් ඇගයීමට භාජනය කළ එක් ලංසුවක් අදාළ ලංසුකරු අත්සන යොදා නොතිබුණු අතර, ආයතන නිල මුද්‍රාව ද යොදා නොතිබුණි. ඒ අනුව එම ලංසුව වලංගු ලංසුවක් නොවන බව නිරීක්ෂණය විය.

02. ලංසුකරුවන් විසින් ඉදිරිපත් කර තිබුණු ලංසුවල වගකීම් කාලය ආදී තොරතුරු ඉදිරිපත් කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(iv) මෙම මිල කියුම් මුදල් කමිටුවට 2025 අගෝස්තු 25 දින විවෘත කළ බවට දක්වා තිබුණද සභාපති විසින් 2025 අගෝස්තු 06 දිනැති ලිපිය මගින් ලංසු මිල ගණන් යාන්ත්‍රික ඉංජිනේරු වෙත සාධාරණීකරණයට යොමු කර තිබුණි. ඒ අනුව මිල කියුම් 2025 අගෝස්තු 06 හෝ එදිනට පෙර විවෘත කර තිබුණු බව නිරීක්ෂණය විය. ප්‍රසම්පාදනයේ මූලික අරමුණක් වන විනිවිදභාවය නොමැතිව ප්‍රසම්පාදනය සිදු වූ බව නිරීක්ෂණය විය.

(V) උක්ත ප්‍රසම්පාදනයට අදාළව ප්‍රසම්පාදන තීරණ පොත පවත්වා ගෙන ගොස් නොතිබුණි.

CamScanner

02. කළමනාකරණ අකාර්යක්ෂමතා.

(අ) ආදාහනාගාරය සතු ඉඩම

පැල්මඩුල්ල ආදාහනාගාරය පිහිටි ඉඩම 1934 වර්ෂයේ අංක 8085 ගැසට් පත්‍රය මගින්, ලොට් අංක 162 හා 162 B අක්කර 03 පර්චස් 19.3 ප්‍රමාණය ප්‍රාදේශීය සභාවට පවරා තිබුණි. මෙම ප්‍රමාණය අවසන් ගම් පිඹුර (FVP) මගින්ද දක්වා තිබුණි. ප්‍රාදේශීය සභාව මගින් විගණිත දිනය වූ 2025 සැප්තැම්බර් 22 දින වන විට, ඉඩමේ ප්‍රමාණය මිනුම් කර වැට සැකසීමේ කටයුතු සිදු කරමින් තිබුණි. එසේ වුවද, මෙම ඉඩම තුළ පුද්ගලයන් 07කු විසින් අනවසරයෙන් පදිංචි වී සිටින බව නිරීක්ෂණය විය.

(ආ) භාවිතයේ නොමැති වාහන සඳහා පූර්ණ රක්ෂණාවරණයක් ලබා ගැනීම.

ප්‍රාදේශීය සභාව සතු අංක RA-7530 ට්‍රැක්ටර් රථය 2021 වර්ෂයේ සිට භාවිතයට ගෙන නොතිබුණි. එසේ වුවද, මෙම ට්‍රැක්ටර් රථය 2021 වර්ෂයේ සිට 2025 වසර දක්වා පූර්ණ රක්ෂණාවරණය ලබා ගැනීම සිදු කර තිබුණි. ඒ සඳහා එකතුව රු.43,719 ක වියදමක් දරා තිබුණි. විස්තර පහත පරිදි වේ.

| කාලය | වටිනාකම (රු.) |
|---|---|
| 2021.10.16 - 2022.10.15 | 10,003.31 |
| 2022.10.16 - 2023.10.15 | 10,936.58 |
| 2023.10.15 - 2024.10.15 | 10,756.27 |
| 2024.10.16 - 2025.10.15 | 12,023.24 |
| | 43,719.40 |

(ඇ) ඉත්තේ, ඉරට්ටේ දිනවල වාහන නවතා තැබීම පුවරු සවි කිරීම.

(i) පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව මගින් 2023 වර්ෂයේ මාර්ගයේ වාහන නවතා තැබීම සීමා කිරීම සඳහා ගුරුදෙල පාලම අසල සිට පැල්මඩුල්ල මහේස්ත්‍රාත් අධිකරණය දක්වා ස්ථාන කිරීම සඳහා 12ක රථවාහන නවතා තැබීම ඉත්තේ සහ ඉරට්ටේ දින ලෙස ප්‍රදර්ශන පුවරු 24ක් සහ වාහන නතර කිරීම තහනම් නාම පුවරු 07ක් ස්ථානගත කර තිබුණි. මේ සඳහා සභා අරමුදලින් රු.82,560ක් වැය දරා තිබුණි. එසේ වුවද, මාර්ගයේ වාහන නතර කිරීමේ සීමාව කුමක් ද යන්න සහ නීතිය ක්‍රියාත්මක වන කාලය පිළිබඳ තොරතුරු 2009 අංක 08 දරණ මෝටර් වාහන (සංශෝධිත) පනතේ 166 (ආ) (1) වගන්තිය ප්‍රකාරව, මහජනයා වෙත ප්‍රසිද්ධ කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

CamScanner

(ii) මාර්ග තදබදය අවම කිරීම සඳහා උක්ත නාම පුවරු සවි කිරීම සිදු කළද, විගණිත දිනය වන විටත් අදාළ පරිදි වාහන නවතා තැබීම සිදු වන්නේද යන්න පිළිබඳව නියාමනයක් සිදු නොවන බව නිරීක්ෂණය විය.

(ඇ) ZA-7153 බැකෝ යන්ත්‍රයේ අනතුර.

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 104 (3) ප්‍රකාරව, යම් අලාභ හානියක් සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්විය යුතු වුවද, සභාව සතු අංක ZA-7153 දරණ බැකෝ යන්ත්‍රයේ 2024 ජුනි 03 දින සිදු වූ අනතුර සම්බන්ධයෙන් මූලික පරීක්ෂණ සිදු කර නොතිබුණි. තවද, අදාළ අළුත්වැඩියාව සඳහා ඇස්තමේන්තුව රු.252,002ක් වුවද, රක්ෂණය මගින් රු.108,184ක් පමණක් ලැබී තිබුණි. විගණිත දිනය වූ 2025 සැප්තැම්බර් 22 දින වන විට අනතුර සිදු වී වර්ෂයකට වැඩි කාලයක් ගත වී තිබුණද, යන්ත්‍රයේ වීදුරුව සැකසීම සිදුකර නොතිබුණු අතර ඒ හේතුවෙන් යන්ත්‍රයේ අභ්‍යන්තරයට වර්ෂාව හා අව්ව මගින් හානිවන බව නිරීක්ෂණය විය.

(ඉ) LF-4824 කැබ් රථය පරීක්ෂාව.

---

ප්‍රාදේශීය සභාව සතු අංක LF-4824 කැබ් රථයෙහි මෝටර් වාහන ලියාපදිංචි කිරීමේ සහතිකය අනුව එන්ජින් අංකය DH84DI3017 විය. එසේ වුවද, 2020 වර්ෂයේ කැබ් රථය සඳහා නව එන්ජිමක් තබා තිබුණු අතර, එහි අංකය 4JBL92R12420 විය. 2008 අංක 09 දරණ මෝටර් රථ (සංශෝධන) පනතේ 09 (1) වගන්තිය ප්‍රකාරව, මෝටර් රථයේ ලේඛනවල මෝටර් වාහනයට අදාළ සටහනක නිවැරදිතාව කෙරෙහි බලපාන යම් කරුණක් වේ නම්, කොමසාරිස් ජනරාල්වරයා වෙත නියමිත ආකෘති පත්‍රයකින් නොපමාව දැන්විය යුතු වුවද, උක්ත ලියාපදිංචි සහතිකය සම්බන්ධව එපරිදි කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඊ) **ස්කිඩ් ලෝඩරය සඳහා ටයර් මිලදී ගැනීම.**

---

ප්‍රාදේශීය සභාව සතු ස්කිඩ් ලෝඩරය සඳහා ගල් ටයර් 04ක් මිලදී ගැනීම සඳහා 2024 ජූලි 31 දින මිල ගණන් කැඳවා තිබුණද, මෙහිදී අවශ්‍ය ගල් ටයර් විශාලත්වය (Size) දක්වා නොතිබුණි. තවද, 2019 වර්ෂයේ මෙම යන්ත්‍රය සඳහා 10x16x5 විශාලත්වයේ ටයර යොදා තිබුණි. සමාලෝචිත වර්ෂයේ 30x10x20 විශාලත්වයේ ටයරය සඳහා මිල කියුම් ලැබී තිබුණි. ඒ අනුව ටයරය විශාලත්වය (Size) වෙනස් කිරීමට හේතුව විගණනයට ඉදිරිපත් නොකෙරුණි. තවද, උක්ත යන්ත්‍රය සඳහා 2025 අප්‍රේල් මාසයේ ටයර් 04 යොදා තිබුණද, වයරින් පද්ධතිය අක්‍රිය වීම මත යන්ත්‍රය විගණිත දිනය වූ 2025 සැප්තැම්බර් 20 දක්වා ධාවනය කර නොතිබුණි. ඒ අනුව රු.1,186,441ක් ගෙවා ටයර් 04 මිලදී ගැනීම නිෂ්කාර්ය වියදමක් වී තිබුණු අතර, ටයරවල වගකීම් කාලයද ඉක්මවා ගොස් තිබුණු බව නිරීක්ෂණය විය.මෙම ප්‍රසම්පාදනය මගින් සඵලදායිතාවය සහ සම්පත් ප්‍රශස්ථ ලෙස ප්‍රයෝජනයට ගැනීම අරමුණු ඉටු නොවන බවද නිරීක්ෂණය කෙරේ.

CamScanner

(උ) වාහන වල බර සහ වේගය සීමා කිරීම හා ධාවනය විධිමත් කිරීම.

---

සභා බල ප්‍රදේශයේ ප්‍රාදේශීය සභා මාර්ගවල බර සීමා සහ වේග සීමා සම්බන්ධව අතුරු ව්‍යවස්ථාව 2008 ජූලි 18 දින සිට ක්‍රියාත්මක වුවද, විගණිත දිනය වූ 2025 සැප්තැම්බර් 20 දින දක්වාම ප්‍රාදේශීය සභා මාර්ග සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථාවේ 03 සහ 04 වගන්ති ප්‍රකාර බර සීමාවන් සහ වේග සීමාවන් පිළිබඳ කටයුතු සිදුකර නොතිබුණු බව නිරීක්ෂණය විය.

එච්.එම්.කේ.කේ.හේරත්,

විගණන අධිකාරි,

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති වෙනුවට.

එච්.එම්.කේ.කේ. හේරත්
විගණන අධිකාරි
ජාතික විගණන කාර්යාලය
බත්තරමුල්ල

පිටපත :- පළාත් පාලන කොමසාරිස්, සබරගමුව පළාත් සභාව - කා.දැ.පි./ අ.ක.ස.

CamScanner